


# හමුදා භාරයට පත්වීම

## සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න

මුල්ලිවායික්කාල් පාර දිගේ වට්ටුවාකල් පාලම පසුකර මුලතිව්වල මධ්‍යම ප්‍රදේශය කරා යන ජන ගංගාව ඇදෙන්නට විය. ජනයා පිටතට ගමන් කරමින් සිටි මාර්ගය හැර මාර්ගයෙහි දෙපස හමුදාව මුල්ලිවයික්කාල් දෙසට ප්‍රහාර එල්ල කරමින් ඉදිරියට ගමන් කරන්නට විය. ජනයාගේ පැමිණීම විශාල ප්‍රමාණයෙන් සිදුවීමක් අපේක්ෂා කරගෙන එයට ගැලපෙන ලෙසින් බොහෝ ආරක්ෂක විධිවිධාන හමුදාව විසින් සකස් කරනු ලැබ තිබුණි. යුද්ධයේ අවසන් අදියරේදී ජනතාව ආරක්ෂා සහිතව පිටතට යාමට සැළැස්වීම පිළිබඳව පූර්ව සැළසුම් සහිතව කටයුතු කර ඇති බව පැහැදිලි විය. ස්වල්ප වේලාවකට පෙර ආයුධ සහිතව හමුදාවට විරුද්ධව කටයුතු කළ අප කෙරෙහි හමුදාව කුමන අයුරින් කටයුතු කරනු ඇතැයි ද යන බිය සහ කැලඹීම් සහගත බව සමඟ එක්ව සටන්කාමීන්ගේ සිත් සාපරාධී හැඟීමෙන් ගැහෙමින් තිබුණි.

මුලතිව් පිට්ටනියට ළඟා වූ මොහොතේ අඳුර ගලමින් තිබුණි. පිට්ටනිය වටකර කම්බි වැටක් ගසා එය වටා හමුදාව මුරට උන්නේය. තුවක්කු උණ්ඩ සහ බෝම්බ කැබලි නොමැති හිතකර තත්ත්වයක් අත්විඳිමින් බඩගින්න සහ තෙහෙට්ටුව විසින් පීඩාවට පත් කරනු ලැබ සිටි ජනයා සියලු දෙනාම තැන් තැන්වල රංචු ගැසී ඉඳගත්තෝය. පිඹුරෙකු සේ මරණය ජනතාව ගිලගෙන නැවත එළියට දමා තිබුණි. ජනතාව සමඟ එක්ව දහස් ගණන් සටන්කාමීන් ද සමඟින් එම පිට්ටනියෙහි ලංකාවේ හමුදාව වෙත තම ඉරණම පවරා දී සැනසුම ගිලිහී ගිය මනසින් යුතුව බලාගෙන උන්නෙමු.

හමුදාව වතුර බෝතල් ද ආහාර පාර්ශල් ද බෙදා දෙමින් උන්නේය. මමත් තවත් පිරිසකුත් සමඟ පිට්ටනිය මැද්දේ වූ තැනක ඉඳගෙන උන්නෙමි. ඇත්තෙන්ම බඩගින්න හෝ පිපාසය හෝ දැනෙන අන්දමේ මානසික මට්ටමක මම නොසිටියෙමි. ඉතාමත් බියකරු වරදක් කළෙමි යන සාපරාධී
හැඟීම පමණක් මාව වේදනාවට පත් කරමින් තිබුණි. හමුදාව ඉතාමත් යුහුසුළුව ජනයාට අවශ්‍ය දේ පිළිබඳව උනන්දුවක් දක්වමින් උන්නේය.

පසු දිනට ආලෝකය පැතිරෙන්නට විය. ඊළඟට සිදුවන්නේ කුමක්ද යන්න පිළිබඳව බිය පිරි අය ලෙසින් ජනයා ඊළඟ අදියරට සූදානම් වෙමින් උන්නෝය. ඔවුහු තම හැඳුනුම්පත් සහ බොහෝ ලේඛන සූදානම්ව තබා ගන්නට වූහ. එලෙස සූදානම් කර තබා ගන්නට අප සතුව කිසිම ලේඛනයක් නොමැත. මගේ ලංකාවේ හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය හෝ නැති වූයේ කෙසේද යන්නවත් මම නොදනිමි. ඒවා මගේ ජීවිතයේදි නැවතත් භාවිතා කිරීමට අවස්ථාවක් ලැබෙනු ඇතැයි මම නොසිතූ හෙයින් මම ඒවා ආරක්ෂා නොකළෙමි.

මා සමඟ පැමිණ සිටි සමහර සටන්කාමීහු ඔවුන්ගේ ඥාතීන්ව නැතහොත් ගමේ අයව හොයා ගෙන ඔවුන් සමඟ එක්ව යන්නට පටන් ගත්හ. මගේ අම්මා හෝ සහෝදරියන්ගේ පවුල්වල අය හෝ එම ජන සන්නිපාතය තුල සොයා ගන්නේ කෙසේද යන්න නොදැන මම තිගැස්සීමට පත්ව උන්නෙමි. දහ අට වියේදී අම්මාට බොරුවක් කියා ගොස් සංවිධානයට බැඳීමෙන් පසුව මට අම්මාගේ ආරක්ෂාව නැවතත් අවශ්‍යව ඇත්තේ දැන්ය. මගේ නැඟණියගේ
ස්වාමිපුරුෂයා කෙසේ හෝ එම ජන ගංගාව මැද්දේ මාව සොයාගත්තේය. ඉතාමත් වේගයෙන් ගොස් ඔහු මගේ අම්මා කැඳවාගෙන එම ස්ථානයට නැවත පැමිණියේය.

අවසන් මොහොත දක්වාම මා වෙනුවෙන් යුද්ධ ප්‍රදේශය තුළ නතර වී සිටි අම්මා මින් මතු මාව දැකගැනීමට නොලැබෙයි යන සිතුවිල්ලෙන් යුතුව මා දුටු වහාම මාව බදාගෙන සිපගනිමින් කඳුළු සළමින් අඬන්නට වූවාය. අම්මා තමන් අදහන සියලුම දෙවිවරුන්ගේ නම් කියමින් ප්‍රාණය ආරක්ෂා කර දුන් දුවගේ ඉදිරි ආරක්ෂාවටත් පිහිට වන මෙන් ආයාචනා කරන්නට වූවාය. උත්සව භූමියකදී අතරමං වූ සිය සිව් හැවිරිදි දරුවාව නැවතත් හමුවූ සැනසීමෙන් යුතුව මාව තම පපුවට තුරුල් කරගත් අම්මාගේ සෙනෙහස ඉදිරියේ මම සාපරාධී හෘදය සාක්ෂියක් සමඟින්
මුලුගැන්වී උන්නෙමි.

අම්මා තම දෙපාවල වේදනාවත්, නොහැකියාවත් අමතක කර හමුදාව බෙදා දෙමින් තිබූ කෑම පාර්සල් සහ පානීය ජලය ආදිය එම ජන පොදිකෑම්වලට මැද්දේ වෙහෙසකින් යුතුව ලබාගෙන මට කන මෙන් පෙරැත්ත කරන්නට වූවාය. පියා අහිමි වූවායින් පසු පවුලේ වැඩිමහල් දියණිය වූ මම කිසි විටෙකත් අම්මාට සැනසිල්ලක් අත්කර දී නැත. අම්මා මා පිළිබඳ තබා තිබූ විශ්වාස බිඳ දමා මම අම්මාට දුක් වේදනාවන් දුන්නා පමණක් නොව, මම මෙතුවක් කිසිම ප්‍රයෝජනයක් නොමැති තැනැත්තියක් ලෙෂ සිටියෙමි. දැන් පවා මම ඇය වෙත පැමිණ සිටින්නේ අනතුරුදායක බරක් ලෙසින්ය. තම අත් පහුරෙන් ගිලිහී යා නොදී කුඩා දරුවෙකුව තම ඇස් මානයේ රඳවා තබාගෙන සිටින්නා සේ අම්මා මා සොයාගෙන ඇවිත් මාව මුණ නොගැසෙන්නට මම අද ජීවතුන් අතර නොමැත.

එදින දහවල මුළුමනින්ම ගෙවුණේ මුලතිව් පිට්ටනියෙහිය. ජනතාව පියවරින් පියවර ඇතුලට ගනිමින් තිබුණත් මුහුදේ රළ සේ ජනයා තව තවත් පැමිණෙමින් සිටියෝය. පරීක්ෂා කිරීම්වලට ලක්ව මමත් අම්මාත් ඇතුළට යාමට අවසරය ලැබෙන විට රාත්‍රිය උදාවෙමින් තිබුණි. එදින රාත්‍රියත් ගෙවුණේ එම පිට්ටනියේදීමය. මමත් අම්මාත් තවත් සටන්කාමී සහෝදරියන් දෙදෙනෙකුත් එහි උන්හ. දුහුවිලි පොළොවේ වස්ත්‍රයක් අතුරා දීර්ඝ කාලයකට පසුව අම්මාගේ ආසන්නයේ ආරක්ෂා සහිතව වැතිර ගෙන මම මගේ වේදනාබර සිතුවිලිවලින් පීඩිතව රැය පුරා නිදි වර්ජිතව උන්නෙමි.

පසුදින උදේ මුලතිව් පාරේ නතර කර තිබූ සිය ගණනක් වූ බස් රථවලට ජනයා නැංවූහ. මම සහ අම්මා එක බස් රථයකට නැඟ ගත්තෙමු. අප ගමන් ගත් බස් රථයේ තවත් සටන්කාමීන්ද, සංවිධානයෙහි රැකවරණ මධ්‍යස්ථාවල සිට පැමිණි ළමුන් ද උන්හ. ආධාර සපයන ආයතනයක කවුරුන් හෝ එම දරුවන්ව භාරගනු ඇතැයි යන විශ්වාසය මා තුළ විය. මෙවන් තත්ත්වයක් තුළ ජීවිත බේරාගෙන සිටි ඔවුන්ගේ මුහුණු දෙස බලත්ම මගේ හදවත ගිනියම් වන්නා සේ විය.

එම වාහන පේලිය ගමන් කළේ තැනින් තැන නතරව ප්‍රමාද වෙමින්ය. 2009 වසරේ මැයි මස 18 වන දින මධ්‍යම රාත්‍රියෙහි දී ඕමන්තේ හමුදා කඳවුරට ළඟා වුනෙමු. සියලු දෙනාටම වාහනයෙන් බැස එක්තරා ස්ථානයක ඉඳගන්නා මෙන් දැනුම් දුන්නේය. මධ්‍යම රාත්‍රියේදි පවා විදුලි බුබුළු ආලෝකය පිටාර ගලමින් තිබුණි. ලංකා රජයේ ජනාධිපතිතුමා විසින් සියලුම ජනතාව පිළිගන්නා බවත්, දීර්ඝ කාලීන යුද්ධයකින් පසුව ජනතාව මුදාගෙන ඇති බවත්, මින් මතුවට කිසිම කරුණකට බියපත් විය යුතු නැති බවත් ඇතුළු බොහෝ කරුණු අයෙක් ශබ්ද විකාශන යන්ත්‍රයක මාර්ගයෙන් දැනුම් දෙමින් උන්නේය.

සුළු මොහොතකට පසුව "සංවිධානයෙහි හිටපු අය නැඟිටලා එන්න. එක දවසක් සංවිධානයේ හිටියත් අනිවාර්යෙන්ම නැඟිටලා එන්න ඕනෑ" යැයි දැනුම් දුන්හ. අම්මා දැඩි ලෙසින් බියපත් වූවාය. සංවිධානයෙහි සිටි අය සඳහා වූ ලියාපදිංචි කිරීමේ කටයුතු අනිවාර්යෙන් වෙනස් විදිහකට සිදුවෙන බව මම තේරුම් ගෙන සිටියෙමි. එහෙයින් මම අම්මාව සැනසීමට ලක් කළෙමි. "බය වෙන්ඩ එපා අම්මේ. අම්මාව යවන්නේ අවතැන් වූ සාමාන්‍ය මිනිස්සුන්ගේ කඳවුරකට. එහෙ නංගිලාගේ සහ මල්ලිලාගේ පවුලේ අය එක්ක අම්මා පරිස්සමින් ඉන්ඩ. මම කොහොම හරි අම්මා එක්ක කතා කරන්නම්. අම්මා බය වෙන්ඩ එපා." යැයි කියා මම පමා නොවී මගේ කුඩා බෑග් එකත් රැගෙන ගොස් සංවිධානයෙහි සිටි අයගේ පෝලිමට එකතු වූයෙමි.

සැඟවී ආරක්ෂා විය යුතු යැයි මම කිසිසේත්ම අදහස් නොකළෙමි. මෙවන් අවස්ථාවක අවංකව කටයුතු කිරීම මාව ආරක්ෂා කරගත හැකි මාර්ගය යැයි මම දැඩිව විශ්වාස කළෙමි. සෑහෙන ප්‍රමාණයක පිරිස එක්රැස් වූ පසුව මඟ පෙන්වන්නෙක් අපව එම ස්ථානයෙහි සිට තවත් ස්ථානයකට කැඳවා ගෙන ගියේය.


